**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 21/93**

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1993,09.08 වෙනි දින

සියළුම ලේකම්වරුන් සහ,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට පත්ව, රාජ්‍ය සේවා අර්ථ සාධක**
**<u>අරමුදලට බැඳී සිටින නිලධාරිණීන්ට විශ්‍රාම වැටුප් තත්ත්වය ප්‍රදනය කිරීම</u>**

1978.02.07 දින අංක 42 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. උක්ත චක්‍රලේඛයේ සඳහන් විධිවිධානයන් අනුව 1977.10.05 දිනෙන් පසුව රජයේ සේවයට පත් කරනු ලැබූ සියළුම නිලධාරිණියන් විශ්‍රාම වැටුප් හිමි පදනමක් මත පත් කළ යුතුය. කෙසේමුත් පූර්වෝක්ත සඳහන් දිනට පසුව විශ්‍රාම වැටුප් හිමි තනතුරු වලට පත් කර ඇති යම් නිලධාරිණියකගෙන් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දයක මුදල් අය කරනු ලබන්නේ නම් එය වහාම නතර කොට ඔවුන්ගේ මුල් පත්වීමේ දින සිට විශ්‍රාම වැටුප් හිමි තත්ත්වය ඔවුන්ට ලබා දිය යුතුය.

03. 1977.10.05 දිනට පෙර විශ්‍රාම වැටුප් හිමි තනතුරු වලට පත් කර ඇති එහෙත් 1978.02.07 දින අංක 42 දරණ විශ්‍රාම වැටුප් චක්‍රලේඛය හෝ දැනට අවලංගු කොට ඇති 1957.04.29 දින අංක 372 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව හෝ රා.සේ.අ. අරමුදලේ රැඳී සිටීමට මනාපය පළ කර ඇති නිලධාරිණියන්ට ස්වකීය මනාපය පරිදි විශ්‍රාම වැටුප් හිමි තත්ත්වය ලබා ගැනීමට අවස්ථාවක් ලබා දීමට රජය දැන් තීරණය කර ඇත.

04. මේ අනුව ඔබ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවල සේවය කරන නිලධාරිණියන්ගේ පෞද්ගලික ලිපිගොනු පරීක්ෂා කොට රා.සේ.අ. අරමුදලට දයකව සිටින සියළුම නිලධාරිණියන්ගෙන් ඇමුණුම 01 ප්‍රකාර මනාප ප්‍රකාශයක් 1993.12.31 ට පෙර ලබා ගෙන එය පෞද්ගලික ලිපිගොනුවට ඇතුලත් කළ යුතුය.

05. වැන්දඹු පුරුෂ හා අනන්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය ආරම්භ වූයේ 1983.08.01 දින සිටය. එබැවින් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 42 ප්‍රකාරව රා.සේ.අ. අරමුදලේ රැඳී සිටීමට මනාපය පළ කර ඇති නිලධාරිණියන් විශ්‍රාම වැටුප් හිමි තත්ත්වයට පත් කරනු ලබන්නේ 1977.10.05 දින සිට බැවින් වැ.පු.අ.වි.වැ. ක්‍රමයට බැඳීමට ද මනාපය පළ කරන්නේ නම් එම මනාපය වැ.අ.වි.වැ. ක්‍රමයේ ලේකම් වෙත ඉදිරිපත් කොට එහි සාමාජිකත්වය ලබා ගන්නා ලෙස ඔවුන්ට දන්වන්න.

06. තවද, පහත සඳහන් උපදෙස් කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

(1) වැන්දඹු පුරුෂ ක්‍රමයේ සාමාජිකත්වය පිළිබඳව වැ.අ.විශ්‍රාම වැටුප් ලේකම් හා ගණකාධිකාරීගේ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය.

(2) විශ්‍රාම වැටුප් සහිත සේවයට පත් කරන ලද බවට සහතිකයක් එක් එක් නිලධාරිණියගේ චර්යා සටහන් පත්‍රයෙහි බලයලත් නිලධාරියෙකු විසින් සටහන් කොට අත්සන් කළ යුතුය. ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධාරිණියක් වි.වැ. සේවයට පත් කරනු ලබන්නේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ විසිනි.

(3) විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 42 ට අනුව වි.වැ. සේවයට ඇතුලත් වීමට මනාපය පළ නොකළ නිලධාරිණියන්ට වි.වැ. සහිත සේවයට ඇතුලත් වීමට ඉඩ ලැබෙන අවසාන අවස්ථාව මෙය විය හැකි හෙයින් මෙම චක්‍රලේඛයට ප්‍රමාණවත් ප්‍රචාරයක් දී එය සියළුම නිලධාරිණියන්ගේ දැනගැනීමට සලස්වන්න.

(4) රා.පරි. චක්‍රලේඛ අංක 44/90 නිකුත් වූ 1990.10.18 දින සිට ඒ යටතේ විශ්‍රාම ගිය නිලධාරිණීන් සම්බන්ධයෙන්ද මෙම විධිවිධාන අදාල වන අතර, 1990.10.18 දින සිට බලපැවැත්වෙන පරිදි විශ්‍රාම වැටුප් ලබා ගැනීමේ අවකාශයන් සැලසිය යුතුය.

(5) රා.සේ.අ. අරමුදලේ රැඳී සිටීමට යම් නිලධාරිණියක් බලාපොරොත්තු වන්නේ නම් එම මනාපයේ පිටපතක් රා.සේ.අ.අ. / ලේකම් වෙත ද එවිය යුතුය.

අ.කලේ/එම්.ඩී.ඩී. පීරිස්
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය

**ඇමුණුම 01**

**අංක 21/93 සහ 1993.09.08 දින**
**දරණ රාජ්‍ය පරිපාලන ලේකම් ගේ චක්‍රලේඛය ප්‍රකාර මනාපය**

01. සේවිකාවගේ නම :-

02. උපන් දිනය :-

03. විශ්‍රාම වැටුප් සහිත තනතුරෙහි පදවි නාමය :-

04. තනතුරට පත් වූ දිනය :-

05. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ දයකත්වයේ සිටි නම් ඒ කෙදිනක සිටද ?

06. අංක 21/93 හා 1993.09.08 දින දරණ රාජ්‍ය පරිපාලන ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාර . . . . . . . . . . . . . . . . . . .. . . .. වන මම රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ රැඳී සිටීමට / විශ්‍රාම වැටුප් සහිත යෝජනා ක්‍රමයට මාරු කරනු ලැබීමට මෙයින් මනාපය පළ කරමි. මේ මනාපය අවලංගු කළ නොහැකි බවත්, මගේ මේ තෝරා ගැනීම පසු අවස්ථාවකදී වෙනස් කර ගැනීමට ඉඩ නොදිය හැකි බවත් මම තේරුම් ගතිමි.

. . . . . . . . . . .. .
සේවිකාවගේ අත්සන

දිනය ::-

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

ඉහත නම සඳහන් සේවිකාව ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරණ බවත්, අංක 21/93 සහ 1993.09.08 දින දරණ රාජ්‍ය පරිපාලන ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව විශ්‍රාම වැටුප් සහිත සේවයට මාරු කරනු ලැබීමට සුදුසුකම් ඇත්තියක් බවත් / තවදුරටත් රා.සේ.අ. අරමුදලේ රැඳී සිටීමට මනාපය පළ කරන්නියක් බවත් / ඉහත සපයා ඇති විස්තර කාර්යාලයේ වාර්තා සටහන් වලට අනුව නිවැරදි බවත් සහතික කරමි.

. . . . . . . . . . . . . .
දෙපාර්තමේන්තු ප්‍රධානියා / විමධ්‍යගත
ඒකකයේ ප්‍රධානියාගේ අත්සන